සියලුම හිමිකම් ඇවිරිණි.

හර්ෂ අමරකෝන්
Harsha Amarakoon

21 | S | I

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
# General Certificate of Education (Advance Level) Examination

## ආර්ථික විද්‍යාව I
## Economics I

- ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා පිළිතුරට හිමි අංකය මෙම පත්‍රයේම තිත් ඉරිමත ලියන්න.

01. ආර්ථික විද්‍යාවේදී හදාරනු ලබන්නේ,

I. සම්පත් හිඟකම හා පූර්ණ සේවා නියුක්තිය පිළිබඳව ය.
II. සම්පත් හිඟකම හා නිෂ්පදනය පිළිබඳව ය.
III. සම්පත් හිඟකම හා තෝරා ගැනීම පිළිබඳව ය.
IV. සම්පත් හිඟකම හා කාර්යක්ෂමතාව පිළිබඳව ය.
V. සම්පත් හිඟකම හා ආදේශකතාව පිළිබඳව ය.

02. "කිසියම් රටක ශ්‍රම හමුදාව සතු කුසලතා සහ දැනුම් සම්භාරය" ආර්ථික විද්‍යාවේදී හඳුන්වනුයේ,

I. මානව සම්පත් යනුවෙනි.
II. ව්‍යවසායකත්වය යනුවෙනි.
III. මානව ප්‍රාග්ධන යනුවෙනි.
IV. කළමනාකරණය යනුවෙනි.
V. සමාජ ප්‍රාග්ධනය යනුවෙනි

03. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සූක්ෂම ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශය වනුයේ කවරක් ද?

I. රජය එකතු කළ අගය මත බද්ද (VAT) 11% සිට 8% දක්වා අඩු කිරීම.
II. රජය ආනයනික අර්තාපල් මත පැනවූ තීරු බද්ද කිලෝවකට රුපියල් 10 කින් ඉහළ නැංවීම.
III. පසුගිය වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 4.8% කින් ඉහළ යාම.
IV. පසුගිය වර්ෂයේ මුදල් සැපයුම 17.8% කින් වර්ධනය වීම.
V. පසුගිය වර්ෂයේ ගෙවුම් තුලන ලේඛනයේ, ජංගම ගිණුමේ හිඟය පුළුල් වීම.

04. නිෂ්පාදන සම්පත් හා භාණ්ඩ අතර මූලික වෙනස පිළිබිඹු කෙරෙන ප්‍රකාශය කුමක් ද?

I. නිෂ්පාදන සම්පත් හිඟකමකින් යුක්ත වන අතර භාණ්ඩ හිඟකමකින් යුක්ත නොවේ.
II. නිෂ්පාදන සම්පත් ඵලදායිතාවකින් යුක්ත වන අතර භාණ්ඩ උපයෝගීතාවක් ලබා දේ.
III. නිෂ්පාදන සම්පත් උපයෝගීතාවක් ලබාදෙන අතර භාණ්ඩ ඵලදායීතාවකින් යුක්ත වේ.
IV. නිෂ්පාදන සම්පත් ස්වභාව ධර්මයේ දායාද ලෙස ලැබෙන අතර භාණ්ඩ නිපදවා ගත යුතුය.
V. නිෂ්පාදන සම්පත් ඵලදායිතාවයකින් යුක්ත වන අතර භාණ්ඩ හිඟකමකින් යුක්ත වේ.

05. බොහෝ පරිභෝජන කටයුතු වලදී සීනි සහ හකුරු එකිනෙකට ආදේශක වශයෙන් සැලකේ. එබැවින් සීනි මිල ඉහළ ගියහොත්,

I. හකුරු ඉල්ලුම වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ.
II. හකුරු ඉල්ලුම අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.
III. හකුරු ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.
IV. හකුරු මිල අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.
V. හකුරු ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ.

06. A, B, හා C යන භාණ්ඩ වල ලක්ෂණ කිහිපයක් පහතින් දැක්වේ.


- A භාණ්ඩයේ ආදායම් ඉල්ලුම් නම්‍යතාවය 1ට වැඩි ධන අගයක් ගැනීම.
- B භාණ්ඩයේ මිලත් ඉල්ලුම් ප්‍රමාණයත් අතර අනුලෝම සම්බන්ධයක් පැවතීම.
- C භාණ්ඩයේ ආදායම් ඉල්ලුම් නම්‍යතාව ඍණ අගයක් ගැනීම.

ඉහත A, B, C භාණ්ඩ පිළිවෙළින් දැක්වෙන්නේ,

I. සුඛෝපභෝගී භාණ්ඩ, බාල භාණ්ඩ, ගිෆන් භාණ්ඩ
II. අත්‍යවශ්‍ය භාණ්ඩ, සුඛෝපභෝගී භාණ්ඩ, බාල භාණ්ඩ
III. සුඛෝපභෝගී භාණ්ඩ, ගිෆන් භාණ්ඩ, බාල භාණ්ඩ
IV. අත්‍යවශ්‍ය භාණ්ඩ, ගිෆන් භාණ්ඩ, බාල භාණ්ඩ
V. සුඛෝපභෝගී භාණ්ඩ, බාල භාණ්ඩ, අත්‍යවශ්‍ය භාණ්ඩ

07. එක්තරා භාණ්ඩයක සැපයුම් වක්‍රය පහතින් දැක්වේ. භාණ්ඩයේ සමතුලිත මිල රු. 15 ක් ලෙස තීරණය වී ඇත්නම් රු. 15 දී නිෂ්පාදක අතිරික්තය,

I. රු. 500
II. රු. 1000
III. රු. 1500
IV. රු. 2000
V. රු. 2500




08. සීනි වෙළෙඳ පොළ තරඟකාරී යැයි සිතන්න. සීනි වෙළෙඳ පොළේ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

$$Qd = 1200 - 10p \qquad Qs = -300 + 15p$$

මෙහි P යන්නෙන් සීනි කිලෝවක මිල රුපියල් වලින් ද, Qd හා Qs මගින් ඉල්ලුම් හා සැපයුම් ප්‍රමාණ කිලෝ දහස් වලින් ද දැක්වේ. රජය සීනි කිලෝවක සහතික මිල රු. 80 ක් ලෙස තීරණය කර, අතිරික්ත සැපයුම මිලදී ගැනීමට අදහස් කරයි නම්, අතිරික්ත සැපයුම මිලදී ගැනීමට රජය දැරිය යුතු වියදම රුපියල් දහස් වලින්,

I. රු.40,000 II. රු.32,000 III. රු.90,000 IV. රු.60,000 V. රු.75,000

09. පෙට්‍රල් සඳහා පවත්නා ඉල්ලුම අතිශයින් අනම්‍ය බවත්, එහි සැපයුම අතිශයින් නම්‍ය බවත් සිතන්න. මෙම තත්ත්වය යටතේ පෙට්‍රල් මත නිෂ්පාදන බද්දක් පනවනු ලැබුවහොත් බදු බර,

I. ඉතා විශාල වශයෙන් ගැණුම්කරුවන් විසින් දරනු ලැබේ.

II. ඉතා විශාල වශයෙන් විකුණුම්කරුවන් විසින් දරනු ලැබේ.

III. ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් විසින් සමසමව දරනු ලැබේ.

IV. මුළුමනින්ම අයබදු ගෙවන්නෝ දරති.

V. ගැණුම්කරුවෝ හෝ විකුණුම්කරුවෝ හෝ නොදරති.

10. නිෂ්පාදන ආයතනයක නිමැවුම් වැඩි කිරීමේදී අඩුවිය හැකි පිරිවැය වන්නේ,

(A) විචල්‍ය පිරිවැය (B) ආන්තික පිරිවැය (C) සාමාන්‍ය විචල්‍ය පිරිවැය

(D) මුළු පිරිවැය (E) ස්ථාවර පිරිවැය (F) සාමාන්‍ය ස්ථාවර පිරිවැය

I. A B C II. D E F III. E පමණි IV. C හා F පමණි V. B C F

11. කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතයේ සාමාන්‍ය ඵලදාව ඉහළ යමින් පවතින විට නිෂ්පාදන ආයතනයේ,

I. මුළු ඵලදාව ඉහළ යයි.

II. ආන්තික ඵලදාව ඉහළ යයි.

III. සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඉහළ යයි.

IV. ආන්තික පිරිවැය පහළ යයි.

V. සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා ආන්තික පිරිවැය පහළ මට්ටමක පවතී.

12. කිසියම් නිෂ්පාදන ආයතනයක ප්‍රාග්ධනය, ශ්‍රමය ඇතුළු සියලුම නිෂ්පාදන සාධක වල සේවා නියුක්තිය 20% න් ඉහළ නංවන විට ආයතනයේ නිමැවුම ඒකක 50,000 සිට 55,000 දක්වා ඉහළ ගියේ ය. මෙයින් නිගමනය කළ හැක්කේ එම නිෂ්පාදන ආයතනයේ,

I. වැඩෙන පරිමාණානුකූල ඵල ක්‍රියාත්මක වන බවයි.

II. ස්ථාවර පරිමාණානුකූල ඵල ක්‍රියාත්මක වන බවයි.

III. හීනවන ඵල ක්‍රියාත්මක වන බවයි.

IV. සාමාන්‍ය පිරිවැය ක්‍රමයෙන් පහළ යමින් පවතින බවයි.

V. සාමාන්‍ය පිරිවැය ක්‍රමයෙන් ඉහළ යමින් පවතින බවයි.

13. සාමාන්‍ය පිරිවැයට වඩා ආන්තික පිරිවැය ඉහළ මට්ටමක පවතී නම් සිදුවිය යුත්තක් වන්නේ,

I. ආන්තික පිරිවැය පහළ යාම.

II. සාමාන්‍ය පිරිවැය පහළ යාම.

III. ආන්තික පිරිවැයට වඩා ආන්තික ආදායම අඩු වීම.

IV. මුළු ස්ථාවර පිරිවැය පහළ යාම.

V. සාමාන්‍ය පිරිවැය ඉහළ යාම.

හර්ෂ අමරකෝන්

14. කිසියම් ආයතනයක් අලෙවි කරන භාණ්ඩයකට ආදේශක නොමැති නම් එය අයත් වෙළෙඳ පොළ වන්නේ,

I. ඒකාධිකාරය
II. කතිපයාධිකාරය
III. අපූර්ණ තරඟය
IV. පූර්ණ තරඟය
V. ඒකාධිකාරී තරඟය

15. 2015 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP) විසින් ලෝක නායකයින් වෙත ඉදිරිපත් කරන ලද "තිරසාර සංවර්ධන අභිමතාර්ථ" සංඛ්‍යාව හා ඒවා ළඟා කරගත යුතු වර්ෂය ලෙස දක්වා ඇත්තේ,

| | **අභිමතාර්ථ** | **ළඟා කර ගැනීමට නියමිත වර්ෂය** |
|---|---|---|
| I. | 17 කි. | 2050 දී ය. |
| II. | 08 කි. | 2030 දී ය. |
| III. | 12 කි. | 2030 දී ය. |
| IV. | 08 කි. | 2025 දී ය. |
| V. | 17 කි. | 2030 දී ය. |

හර්ෂ අමරකෝන්